ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.09.25 චක්‍රලේඛ අංක 77 /2026

සියලුම දිසා කොමසාරිස්වරුන් වෙත,

## වාර්ෂික බාලදක්ෂ සංගණනය - 2026

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් වාර්ෂිකව පවත්වනු ලබන බාලදක්ෂ සංගණනය හා තොරතුරු රැස්කිරීම, අගෝස්තු 31 වන දිනට අදාළ වන පරිදි දිවයින පුරා පැවැත්වීමට තීරණය කර ඇත.
මෙම චක්‍රලේඛනය අනුව නියමිත පරිදි අදාල සංගණන තොරතුරු ලබා දීම තුලින් චක්‍රලේඛ අංක 12/2026 හා 22/2026 චක්‍රලේඛ අහෝසි වන බව මෙයින් දන්වා සිටිමු.

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, ලෝකයේ ජාතික බාලදක්ෂ සංගම් 176 ක් නියෝජනය කරමින් සාමාජිකයන් මිලියන 60 කින් සමන්විත ලෝක බාලදක්ෂ සංවිධානයේ (WOSM) සාමාජිකයෙක් වන අතර ලෝක බාලදක්ෂ ව්‍යාපාරයේ සියලුම සංවර්ධන කටයුතු,ජාතික බාලදක්ෂ සංගම් (NSO) විසින් තම රටෙහි බාලදක්ෂ සාමාජිකයින්ගේ වාර්ෂික සංගණනයෙන් එකතුකර ගන්නා සාමාජික මුදල් මත රඳා පවතින බවත් ඒ නිසා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ දිසා සංගම්වල ඇති බාලදක්ෂ සමූහවලට අයත් ලියාපදිංචි වී ඇති සියළුම සුපිපි,සිහිති,පෝතක,බාලදක්ෂ හා මානවක බාලදක්ෂයින් හා නායක නායිකාවන් හා ගිහි සාමාජිකයින් වාර්ෂික සංගණනයට එකතුකර ගැනීම අනිවාර්ය බව දන්වා සිටිමු.

ශ්‍රී ලංකාවේ බාලදක්ෂ කටයුතු ආරම්භ කර වසර 115 ක් පිරීම සනිටුහන් කරමින් “115 වන සංවත්සර” පදක්කමක් නිකුත් කිරීමට නියමිත අතර එම පදක්කම 2027 වර්ෂය පුරා සුපිපි,සිහිති,පෝතක,බාලදක්ෂ,මානවක බාලදක්ෂයන් තම නිල ඇඳුමේ පැලඳිය යුතු අතර එම පදක්කම ද සංගණන පදක්කම සමග නිකුත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

➢ <u>වාර්ෂික බාලදක්ෂ සංගණනය සඳහා ඇතුලත්වීමට සුදුසුකම් ලබන පිරිස</u>

- සියළුම අංශ වල සුපිපි,සිහිති,පෝතක,බාලදක්ෂ හා මානවක බාලක බාලිකාවන්,
- සියළුම අංශ වල සුපිපි,සිහිති,පෝතක,බාලදක්ෂ හා මානවක බලපත්‍රධාරී නායක නායිකාවන් සහ සහය බාලදක්ෂ නායක නායිකාවන් (2026 වසරට අධිකාරීපත්‍ර නවීකරණයට අයදුම් කළ සහ අළුතින් අධිකාරීපත්‍ර අයදුම් කළ සුපිපි,සිහිති,පෝතක,බාලදක්ෂ හා මානවක නායක නායිකාවන්)
- සියළුම බාලදක්ෂ සමූහයන්හි සමූහ බාලදක්ෂ නායකයින්, නායිකාවන් ( 2026 වසරට අධිකාරීපත්‍ර නවීකරණයට අයදුම් කළ සහ අළුතින් අධිකාරීපත්‍ර අයදුම් කළ නායකයින් සහ නායිකාවන්)
- සියළුම බාලදක්ෂ සමූහයන්හි සමූහාධාර කමිටුවේ සිටින ගිහි සාමාජිකයින්,
- දිසා සංගමයේ දිසා කොමසාරිස් ඇතුළු සහය දිසා කොමසාරිස්වරුන්,කොමසාරිස්වරියන්,දිසා බාලදක්ෂ නායකයින්,නායිකාවන්
- දිසා සංගමයේ සාමාජිකත්වය හිමි සියළුම ගිහි සාමාජිකයින්.


ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

## සංගණන තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කිරීම හා සාමාජික මුදල් ගෙවීම සඳහා පොදු උපදෙස්

1) මෙම සංගණන දත්ත පරිගණක ගත කිරීමට අපේක්ෂාකරණ හෙයින් නිවැරදි තොරතුරු අනුව ම පෝරම සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙන ලෙස දන්වාසිටිමු.

- අදාළ දත්ත සහය දිසා කොමසාරිස් (පරිපාලන) ගේ අධීක්ෂණය යටතේ පිරවිය යුතු වේ.

❖ ඇමුණුම 1 - A පෝරමය

බාලදක්ෂ සමූහයන්හි සියළුම අංශ වල සුපිපි කැලවල්,සිඟිති බාලදක්ෂ ගොමුවල,පෝතක බාලදක්ෂ රැළ වල් වල,බාලදක්ෂ කණ්ඩායම්වල හා මානවක සමාජ වල බාලක බාලිකාවන්ගේ තොරතුරු වෙන වෙන ම සම්පූර්ණ කර තම සමූහයන්හි සමූහ බාලදක්ෂ නායක / විදුහල්පති තුමා ගේ අනුමැතිය සහිතව,දිසා කොමසාරිස්තුමා මඟින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු වේ.

❖ ඇමුණුම 2 - B පෝරමය

බාලදක්ෂ සමූහයන්හි සියළුම අංශ වල සුපිපි,සිඟිති,පෝතක,බාලදක්ෂ හා මානවක බලපත්‍රධාරී නායක නායිකා හා සහය බාලදක්ෂ නායක/නායිකාවන් (2026 වසරට අධිකාරිපත්‍ර නවීකරණයට අයදුම් කළ සහ අළුතින් අධිකාරිපත්‍ර අයදුම් කළ සුපිපි,සිඟිති,පෝතක,බාලදක්ෂ හා මානවක නායක/නායිකාවන්) තොරතුරු ආශ්‍රයෙන් සම්පූර්ණ කර තම සමූහයන්හි සමූහ බාලදක්ෂ නායක/විදුහල්පති තුමාගේ අනුමැතිය සහිතව දිසා කොමසාරිස් තුමා මඟින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු වේ.

❖ ඇමුණුම 3 - C පෝරමය

සංගණන භාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පුරවා, දිසා කොමසාරිස් තුමා මගින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු ය.

2) මෙසේ පෝරම හා මුදල් ගෙවා සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික්ක වලට පමණක් 2027 සංගණන පදක්කම් නිකුත් කරනු ලබන අතර බාලදක්ෂයින්ගේ හා බාලදක්ෂ නායකයින්ගේ සියලුම පදක්කම් හා ප්‍රදානයන් දිනා ගැනීමට එම වසරට අදාළ සංගණන පදක්කම ලබා තිබීම අනිවාර්ය වන බවද සැලකිය යුතුය.( මුදල් ගෙවූ රිසිට් පතෙහි දිසාව හා අදාල බැංකුවේ කේත අංකය සඳහන් කිරීම අනිවාර්ය වේ.)

3) <u>සංගණනය සඳහා ගෙවිය යුතු මුදල</u>
සුපිපි,සිඟිති,පෝතක,බාලදක්ෂ හා මානවකයින්,බාලදක්ෂ නායක නායිකාවන්,කොමසාරිස්වරුන් හා ගිහි සාමාජිකයින් සඳහා 2027 වර්ෂයට සංගණන ගාස්තුව රු. **100.00** වේ. **"115 සමරු පදක්කම"** සඳහා රු **100.00** ක මුදලක් ගෙවිය යුතුය. සංගණන සඳහා ගෙවියුතු මුදල සහ "115 වන සංවත්සර" පදක්කම සඳහා ගෙවිය යුතු මුදල වෙන් වෙන්ව තැම්පතු පත්‍රිකා මඟින් බැංකු ගත කල යුතු ය.

4) <u>සංගණන මුදල් හා "115 වන සංවත්සර" පදක්කම් සඳහා මුදල් බැර කළයුතු බැංකු ශාඛාව හා ගිණුම් අංකය</u>
**204 100130085324 - මහජන බැංකුව - මුලස්ථාන ශාඛාව**

5) <u>මෙම තොරතුරු බාලදක්ෂ මූලස්ථානයට එවිය යුතු දිනය</u>

**2026 ඔක්තෝම්බර් 08**

6) මෙම තොරතුරු බාලදක්ෂ මූලස්ථානයට එවිය යුතු විද්‍යුත් ලිපිනය

slsa.census@gmail.com

7) මුදල් ගෙවීමෙන් පසු සංගණන සහ "115 වන සංවත්සර" පදක්කම සඳහා මුදල් ගෙවූ තැන්පතු පත්‍රිකා slscout5@yahoo.com යන ලිපිනයට ඊමේල් කර එවිය යුතුය.

8) ඊමේල් කරන රිසිට්පතෙහි

I. සංගනන මුදල් ගෙවූ තැන්පත් පතෙහි - මුදල් තැන්පත් කරන්නාගේ නම,දිනය,දිසාව,තැන්පත් කරන මුදල් ප්‍රමාණය,මුදල් ගෙවනු ලබන සාමාජිකයින් ගණන හා සංගණන 2026 ලෙස සඳහන් කර එවිය යුතුය.

II. "115 වන සංවත්සර" පදක්කම සඳහා මුදල් ගෙවූ තැන්පත් පතෙහි - මුදල් තැන්පත් කරන්නාගේ නම,දිනය,දිසාව,තැන්පත් කරන මුදල් ප්‍රමාණය,මුදල් ගෙවනු ලබන සාමාජිකයින් ගණන හා "115 වන සංවත්සර පදක්කම" ලෙස සඳහන් කර එවිය යුතුය.

( CDM මැෂින් හරහා මුදල් තැන්පත් කිරීම මගින් අනන්‍යතාවය තහවුරු කර ගත නොහැකි වන බැවින් එසේ මුදල් තැන්පත් කිරීමෙන් වළකින ලෙස වැඩිදුරටත් දන්වා සිටිමු.)

**වැඩිදුර තොරතුරු සඳහා - තිළිණ ආර්. දන්තසිංහ - මූලස්ථාන කොමසාරිස් - 0761 872 878**

ස්තූතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

**සම්පත් කාරියවසම්**
සහය ප්‍රධාන කොමසාරිස් (මූල්‍යය හා කළමණාකරන)

**නීතිඥ මනෝජ් නානායක්කාර**
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත් -

සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික
මූලස්ථානයේ සියළු ම කොමසාරිස්වරුන් ( කා.දැ.පි)
කාර්යාල ලිපි ගොනුවට

Sampath Kariyawasam
Assistant Chief Commissioner
(Management & Finance)
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka